(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 23.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2015 නොවැම්බර් මස 28 වැනි සෙනසුරාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

169/'15

1.

ගරු ලකී ජයවර්ධන මහතා,— සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය සමයේ දේශපාලන හේතූන් මත, දිවි නැගුම දීමනා නොලැබූ අඩු ආදායම්ලාභී පවුල් සිටින බව එතුමා දන්නේද;

(ii) එසේ නම්, ඔවුන්ට ඉතා කඩිනමින් එම දීමනා ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දිවයින පුරා සිටින දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් දීමනා ලබා දෙන අඩු ආදායම්ලාභී පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පිරිසට ලබාදෙන දීමනාවන්ගේ මුළු මාසික වටිනාකම කොපමණද;

(iii) මෙම දීමනා ප්‍රමාණයන් කාණ්ඩ අනුව වෙන්කර තිබේද;

(iv) ඉහත (iii) හි සඳහන් කාණ්ඩ අනුව එක් එක් අයට ලබාදෙන දීමනා ප්‍රමාණයන් කවරේද;

(v) දිවයිනෙහි කාණ්ඩ අනුව දීමනා ලබාගන්නා පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) 2015 ජනවාරි 08 දින බිහිවූ යහපාලනය තුළ දිවි නැගුම දීමනාලාභීන් සඳහා දීමනා වැඩිකර තිබේද;

(vii) එසේ නම්, වැඩි වූ දීමනා එක් එක් කාණ්ඩය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

174/'15

2.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.06.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශ්‍රාමික නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ පිහිටුවීමට අදාළ අනුමතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති බවත්;

(ii) ඉහත අනුමතිය ප්‍රකාරව, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් 2015.07.17 දිනැති අංක ED/4/58/16/01/04 දරන ලිපියෙන්, විශ්‍රාමික අධ්‍යාපන පරිපාලන සේවා නිලධාරීන් නැවත සේවයේ යොදවන මෙන් අදාළ සියලු පාර්ශ්වයන් වෙත උපදෙස් ලබා දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 2015 සැප්තැම්බර් 01 දින වනවිට, දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු සඳහා අයදුම් කර ඇති විශ්‍රාමික අධ්‍යාපන පරිපාලන සේවා නිලධාරීන්ගේ නම් කවරේද;

(ii) ඔවුන් විධිමත් ලෙස නැවත සේවයේ පිහිටුවනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— 2015 දෙසැම්බර් මස 03 වැනි බ්‍රහස්පතින්දා, 04 වැනි සිකුරාදා, 05 වැනි සෙනසුරාදා, 07 වැනි සඳුදා, 08 වැනි අඟහරුවාදා, 09 වැනි බදාදා, 10 වැනි බ්‍රහස්පතින්දා, 11 වැනි සිකුරාදා, 12 වැනි සෙනසුරාදා, 14 වැනි සඳුදා, 15 වැනි අඟහරුවාදා, 16 වැනි බදාදා, 17 වැනි බ්‍රහස්පතින්දා, 18 වැනි සිකුරාදා සහ 19 වැනි සෙනසුරාදා, "විසර්ජන පනත් කෙටුම්පත (2016)" සලකා බැලීම සඳහා වෙන් කළ දිනයන් විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 70(2) හි කුමක් සඳහන් ව තිබුණද, "විසර්ජන පනත් කෙටුම්පත (2016)" සලකා බැලීම සඳහා 2015 දෙසැම්බර් මස 03 වැනි දින සිට දෙසැම්බර් මස 19 වැනි දින දක්වා වෙන් කළ දිනයන්හි පාර්ලිමේන්තුවේ රැස්වීම් පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ. භා. 12.30 දක්වා ද, අ. භා. 1.00 සිට අ. භා. 7.00 දක්වා ද විය යුතු ය. අ. භා. 6.30ට ස්ථාවර නියෝග අංක 7(5) සහ (6) ඡේද ක්‍රියාත්මක විය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 70(2) හි සහ අද දින සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, "විසර්ජන පනත් කෙටුම්පත (2016)" සලකා බැලීම සඳහා වෙන් කළ, 2015 දෙසැම්බර් මස 04, 11 සහ 18 වැනි සිකුරාදා දිනයන්හි පාර්ලිමේන්තුවේ රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.30 සිට අ. භා. 12.30 දක්වා ද, අ. භා. 1.30 සිට අ. භා. 7.00 දක්වා ද විය යුතු ය. අ. භා. 6.30ට ස්ථාවර නියෝග අංක 7(5) සහ (6) ඡේද ක්‍රියාත්මක විය යුතු ය.

4.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 3),— 2015 නොවැම්බර් මස 06 වැනි සිකුරාදා සහ අද දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවල කුමක් සඳහන් වුවද, 2015 දෙසැම්බර් මස 02 වැනි බදාදා සහ 19 වැනි සෙනසුරාදා පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ. භා. 12.30 දක්වා ද, අ. භා. 1.00 සිට අ. භා. 5.00 දක්වා ද විය යුතු ය. අ. භා. 5.00ට කථානායකවරයා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

විසර්ජන පනත් කෙටුම්පත (2016) — (හයවැනි වෙන් කළ දිනය) — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2015 නොවැම්බර් 20) [1]

*2.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 36 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනු ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් ජනාධිපති ධුරය දරන තැනැත්තාගේ වැටුප, දීමනා හා විශ්‍රාම වැටුප් හිමිකම යෝජනා සම්මතයෙන් නිශ්චය කළ යුත්තේ ය.

ජනාධිපති ධුරය දරන තැනැත්තාගේ විශ්‍රාම වැටුප්, හිමිකම, එම ධුරය දැරීම අවසන් වීමට පෙරාතුවම ලැබීමට හිමිකම තිබූ වැටුපට සමාන මුදලක් වියයුතු බව 1986 මාර්තු මස 04 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනා සම්මතය මගින් නිශ්චය කරන ලදී.

ඊට අනුකූලව, 1988 වර්ෂයේ සිට ඉදිරියට හිටපු ජනාධිපතිවරයන් වන ජේ.ආර්. ජයවර්ධන මහතාට, ඩී.බී. විජේතුංග මහතාට, හිටපු ජනාධිපති ආර්. ප්‍රේමදාස මහතාගේ වැන්දඹු බිරිඳ වන හේමා ප්‍රේමදාස මහත්මියට සහ හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මියට ගෙවනු ලැබූ විශ්‍රාම වැටුප ජනාධිපතිවරයාගේ වැටුපට සමාන මුදලක් වූ මාසයකට රු. 25,000/- ක් විය.

2006 නොවැම්බර් මස 23 වැනි දින නිකුත් කරන ලද 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මගින් 2006.07.01 දින සිට බලපවත්වන පරිදි එවකට ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ වැටුප මාසයකට රු. 25,000/- සිට රු. 97,500/- දක්වා ප්‍රතිශෝධනය කරන ලදී. අමාත්‍යවරයන්ගේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ පාරිශ්‍රමික හෝ දීමනා ද ප්‍රතිශෝධනය කරන ලදී.

අමාත්‍යවරයන්ගේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ පාරිශ්‍රමික හෝ දීමනා ප්‍රතිශෝධනය කිරීමට සමගාමීව කලින් සිටි අමාත්‍යවරයන්ගේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ විශ්‍රාම වැටුප් ද ප්‍රතිශෝධනය කරන ලදී. ජනාධිපතිවරයාගේ වැටුප ප්‍රතිශෝධනය කිරීමට අනුකූලව හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මියට ගෙවනු ලබන විශ්‍රාම වැටුපෙහි පමණක් කිසිදු ප්‍රතිශෝධනය කිරීමක් සිදු වී නොමැත.

ඉහත කී වැටුප් ප්‍රතිශෝධනයේ ප්‍රතිඵලයන් වශයෙන් හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාට දැනට ගෙවනු ලබන රු. 97,500/- ක මාසික විශ්‍රාම වැටුපට අනුව සලකන විට, මාසයකට රු. 25,000/- ක මාසික විශ්‍රාම වැටුපක් දැනට ලබන හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මියගේ විශ්‍රාම වැටුප් හිමිකමෙහි විෂමතාවයක් පැන නැගී ඇත.

ඉහත සඳහන් විෂමතාවයන් නිවැරදි කිරීම සාධාරණ හා යුක්ති සහගත යැයි අදහස් කරන බැවින්—

(අ) හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මියගේ මාසික විශ්‍රාම වැටුප් හිමිකම රු. 25,000/- සිට රු. 97,500/- දක්වා ප්‍රතිශෝධනය කිරීමටත්;

(ආ) හිටපු ජනාධිපති ආර්. ප්‍රේමදාස මහතාගේ වැන්දඹු බිරිඳ වන හේමා ප්‍රේමදාස මහත්මියට රු. 97,500/- ක වැටුපෙන් 2/3 කට සමාන මාසික විශ්‍රාම වැටුපක් ගෙවීමට;

සහ

(ඇ) 2016.01.01 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි ඉහත සඳහන් විශ්‍රාම වැටුප් හිමිකම් ප්‍රතිශෝධන ක්‍රියාත්මක කිරීමටත්;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 36 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනු ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

මුදල් අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝග,— 2004 අංක 11 දරන මුදල් පනතේ 22 වැනි වගන්තිය සමග කියවිය යුතු 26 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 මැයි 18 දිනැති අංක 1915/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.11.03 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

මුදල් අමාත්‍යතුමා,— දේශීය ආදායම් පනත යටතේ යෝජනාව,— 2015.09.23 දින ඉදිරිපත් කරන ලද, ආදායම් මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු පැහැර හැරීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ සිංගප්පූරු ජනරජයේ ආණ්ඩුව අතර, 2014 අප්‍රේල් මස 03 වැනි දින ඇතිකරගත් ගිවිසුම, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 97(1)(අ) වගන්තිය යටතේ අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

මුදල් අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2014 සැප්තැම්බර් 30 දිනැති අංක 1882/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

මුදල් අමාත්‍යතුමා,— 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ නියෝගය,— 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 13(1)(ඇ) වැනි වගන්තිය සහ 16 වැනි වගන්තිය සමග කියවිය යුතු, 112 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 මාර්තු 25 දිනැති අංක 1907/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.11.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

මුදල් අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2015 සැප්තැම්බර් 21 දිනැති අංක 1933/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.11.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2015 ඔක්තෝබර් 2 දිනැති අංක 1934/40 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.11.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥා පනත යටතේ නිවේදනය,— කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 වැනි අධිකාරය වන) සුරාබදු ආඥාපනතේ, 22 වැනි වගන්තියෙහි (1) වැනි උපවගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2015 ඔක්තෝබර් 2 දිනැති අංක 1934/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.11.21 වැනි දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 975, 976 සහ 977 දරන සුරාබදු නිවේදන)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා,— 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ කරන නියෝගය,— 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 54 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ නිර්දේශය මත විදුලිබල (විදුලි පරීක්ෂකවරුන්ගේ කාර්යය, කර්තව්‍ය හා කාර්යය පටිපාටි) පිළිබඳව විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 ජුනි 8 දිනැති අංක 1918/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.11.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා,— සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත යටතේ කරන නියමය,— 2002 අංක 25 දරන සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 අගෝස්තු 6 දිනැති අංක 1926/46 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.11.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— කලින් කලට සංශෝධනය කරන ලද (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 28 (අ) වැනි වගන්තිය සමඟ කියවිය යුතු, 16 (ඇ) වගන්තිය යටතේ සුරාබදු බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2015 පෙබරවාරි 13 දිනැති අංක 1901/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 973 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---